# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,488 — 1965 අගෝස්තු 21 වැනි සෙනසුරාදා — 1965.8.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඩී.-බී. 30/52.

### කාර්මික ආරවුල් පනත

#### 48 වැනි වගන්තිය යටතේවූ ආඥාව

(131 වැනි අධිකාරය වන) කාර්මික ආරවුල් පනතෙහි 48 වැනි වගන්තිය යටතේ කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති.

1965 අගෝස්තු 21 දින, කොළඹදීය.

#### ආඥාව

1. පහත සඳහන් කර්මාන්තය, ජන ජීවිතයට අත්‍යාවශ්‍ය කර්මාන්තයක් විය යුතුයයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

1961 අංක 67 දරණ පනතින් සංශෝධිත, 1958 අංක 13 දරණ වරාය (නැව්බඩු) සංස්ථා පනතෙහි 4(1) වැනි වගන්තියෙහි වරාය සේවා යනුවෙන් සඳහන් කරනු ලැබූ නැව්බඩු පැටවීම, ගොඩබෑම, ගුදම්වල ගබඩා කිරීම, වාෂ්ප වැඩ, ජලය සැපයීම, නැව්වලට රට අහුරු සැපයීම සහ ඒ සේවාවන් ඉටු කිරීමෙහි ලා ආනුෂාංගික වූ හෝ සම්බන්ධ වූ වෙන යම් සේවාවන් ඇතුළුව වරාය (නැව්බඩු) සංස්ථාව විසින් ඉටුකරනු ලබන සේවා.

2. කොළඹ වරායට අදාළව ඉහත කී 48 වන වගන්තිය යටතේ පනවනු ලැබ 1950 නොවැම්බර් 29 වන දින අංක 11,012 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද ආඥාව මෙයින් අවලංගු කරනු ලැබේ.

8–928

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### රේගු නිවේදනය අංක 61/9/195

ආදයම් රක්ෂණ ආඥාපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1965 අගෝස්තු මස 23 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

| රබර් | රු. ශ. |
|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... ... ... | 1 05 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ... ... ... | 0 07 |

ග. කුමාරණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ. 781.
1965 අගෝස්තු මස 21 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

8–922

1253—ආර් 8298—6,525 (65/8)

## රේගු දැන්වීම අංක 64/5/55

1964 අගෝස්තු මස 8 වෙනි දින අංක 14,138 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරණ ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡේදය යටතේ පැනෙන ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, 1965 අගෝස්තු මස 23 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් අමෙරිකානු ඩොලර් 212 3/10 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | අමු පොල් ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|---|---|---|
| රු. ශ. | | රු. ශ. | | රු. ශ. | | රු. ශ. |
| 282 03 | ... | 271 43 | ... | 230 51 | ... | 70 51 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

ශ. කුමාරණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ. 744/22.
1965 අගෝස්තු මස 21 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

8-923

ලංකාවේ වැලව්වේතයෙයි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි